56

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී තෙවන වසර දෙවන අර්ධ වාර්ෂික පරීක්ෂණය - 2019 පෙබරවාරි / මාර්තු

ආර්ථික විද්‍යාව

# ECON 3230.03 – අන්තර්ජාතික මූල්‍යය

කාලය: පැය තුන (03) යි

ප්‍රශ්න පහ(05)කට පමණක් පිළිතුරු සපයන්න.

**පැහැදිලි අත්අකුරු පිළිබඳ සැලකිලිමත්වන්න.**

1. අ) ගෙවුම් ශේෂ ලේඛනය ඉදිරිපත් කිරීමේ නව ආකෘතිය පැහැදිලි කරන්න. (ලකුණු 10)

   ආ) ''ගෙවුම් ශේෂ ලේඛනයක් මඟින් රටක දේශීය ආර්ථිකයේ ශක්තිමත්භාවය පෙන්නුම් කරයි'' පැහැදිලි කරන්න.

   (ලකුණු 10)

2. අ) විදේශ විනිමය වෙළෙඳපොළක කාර්යභාරය ඔබ හඳුනාගන්නේ කෙසේද? පහදන්න.

   (ලකුණු 07)

   ආ) විදේශ විනිමය අනුපාතය තීරණය වන්නේ කෙසේද? රූප සටහන් ආශ්‍රයෙන් විවරණය කරන්න.

   (ලකුණු 08)

   ඉ) විදේශ විනිමය අනුපාතයේ අවශ්‍යතාව තර්කානුකූලව විභාග කරන්න. (ලකුණු 05)

3. අ) ස්ථාවර හා නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තිවල වෙනස්කම් හඳුනාගනු ලබන්නේ කෙසේද? විස්තර කරන්න.

   (ලකුණු 12)

   ආ) ඉදිරි ආධික්‍යය හා ඉදිරි වට්ටම යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? සමපේක්ෂකයෙකු සඳහා මින් වඩාත් වැදගත් වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

   (ලකුණු 08)

*********

4. ආ) විදේශ විනිමය අවදානම අවම කිරීම සඳහා යොදාගන්නා උපායමාර්ග මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ආ) ශ්‍රී ලංකාවේ ආනයනකරුවෙකු මාස 03ක් කල්පිරෙන ඉදිරි ගිවිසුමක් යටතේ එක්සත් ජනපද ඩොලර් 1000ක වටිනාකමකින් යුතු භාණ්ඩ තොගයක් එක්සත් ජනපදයෙන් ආනයනය කරයි (ඉදිරි විනිමය අනුපාතය 1:110 යැයි සලකන්න). ගිවිසුම කල්පිරෙන අවස්ථාවේ එතැන් විනිමය අනුපාතය 1:100 වන්නේ නම්;

i). විනිමය අවදානමේ ස්වභාවය පැහැදිලි කරන්න. (ලකුණු 03)

ii). විනිමය අවදානම අවම කරගැනීම සඳහා ආනයනකරුට ගතහැකි ප්‍රාථමික ක්‍රියාමාර්ගය පැහැදිලි කරන්න.

(ලකුණු 05)

iii). මෙම ආනයනකරුට විනිමය අවදානම අවම කර ගැනීමට "ඉදිරි රැකුම්" යොදා ගතහැකි ද? පහදන්න.

(ලකුණු 06)

5. අ) "ක්‍රයශක්ති සාම්‍ය න්‍යාය විනිමය අනුපාතිකය තීරණය වීම පිළිබඳව ප්‍රායෝගික අදහසක් ඉදිරිපත් කරනු ලබයි" ඔබ එකඟ වන්නේ ද? හේතු දක්වන්න.

(ලකුණු 06)

ආ) විනිමය අනුපාතික අතිධාවනය යන්නෙන් අදහස් වන්නේ කුමක්ද? රූප සටහන් ආශ්‍රයෙන් විවරණය කරන්න.

(ලකුණු 07)

ඉ) නම්‍ය විනිමය අනුපාතික ප්‍රතිපත්තියක් යටතේ විනිමය වෙළෙඳපොළ නම්‍යතාව සාපේක්ෂව අඩු නම්, විනිමය වෙළෙඳපොළ අසමතුලිතයක දී විනිමය අනුපාතිකය විශාල වශයෙන් ක්ෂය වන බව පෙන්වාදෙන්න.

(ලකුණු 07)

6. අ) ගෙවුම් ශේෂ තුලන වක්‍රය හඳුන්වා එහි බෑවුම තීරණය වන්නේ කුමන සාධක මතදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) "විදේශීය ප්‍රාග්ධන ගලනයන් පූර්ණ පොලී අසංවේදී වන විට ප්‍රසාරණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති ඉතා කාර්යක්ෂම වේ" රූප සටහන් භාවිතයෙන් මෙම ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 10)

**********